# තොරතුරු දැන ගැනීමේ පනතේ අර්ධ වාර්ෂික වාර්තාව : 2022.01.01 – 2022.06.30

**අමාත්‍යාංශයේ නම** : ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
**ලිපිනය** : ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, 07 වන මහල, සෙත්සිරිපාය අදියර II , බත්තරමුල්ල
**වෙබ් අඩවිය** : www.transport.gov.lk
**දුරකථන අංකය** : 011-2187200 / 011-2187201
**විද්‍යුත් තැපැල් ලිපිනය** : Secmintransport@gmail.com

| අනු අංකය | නම | තනතුර | දුරකථන අංකය |
|---|---|---|---|
| 1 | ආර්.ඩබ්.ආර්.පේමසිරි මහතා | ලේකම් | 011-2187233 |
| 2 | එල්.එච්. තිලකරත්න මහතා | අතිරේක ලේකම් (පාලන) | 011-2187202 |
| 3 | කේ.පී.බී.වී. සිල්වා මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | 011-2078589 |
| 4 | පුරප්පාඩු | අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) | 011-2187206 |
| 5 | ඩබ්.ඒ.ඩී.එස්. ගුණසිංහ මහතා | අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) | 011-2187238 |
| 6 | ඒ.ඒ.ටී.කේ. අදිකාරි මහත්මිය | ප්‍රධාන මූල්‍ය නිලධාරි | 011- 2187216 |
| 7 | කේ. ජී. සුමුදු දිනේෂා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | 011-2187204 |
| 8 | වී.කේ.එච්.කෝලිත මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 011-2671559 |
| 9 | ජී.සුබ්‍රමනියම් මහත්මිය | ගණකාධිකාරී I | 011-2187214 |
| 10 | ආර්.එල්. මොලගොඩ මහතා | අධ්‍යක්ෂ (තාක්ෂණ) | 011-2187208 |
| 11 | ආර්.ඒ.කේ.රේණුකා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දුම්රිය පාලන) | 011-2687435 |
| 12 | එන්.වී.එන්.ඩී.ජයවර්ධන මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන පාලන) | 011-2187229 |
| 13 | ටී.සී.පුෂ්පකුමාරි මහත්මිය | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 011-2187213 |
| 14 | එම්.යූ.එස්. ප්‍රියදර්ශන මහතා | ගණකාධිකාරී (ගබඩා හා ගිණුම්) | 011-2186261 |
| 15 | මේනකා ඩබ්.රාජපක්ෂ මහත්මිය | සහකාර ලේකම් (පාලන) | 011-2187218 |
| 16 | එන්.එම්.එම්. මුෂාරත් මහතා | සහකාර ලේකම් (දුම්රිය පාලන) | 011-2671561 |
| 17 | කේ.කේ.ඊ.අයි.යූ. කුමාරි මහත්මිය | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 011-2187236 |
| 18 | බී.එම්.ආර්.පී. බණ්ඩාරනායක මෙනවිය | අධ්‍යක්ෂ (සැලසුම්) වැ.බ | 011-2187239 |
| 19 | සී.එස්. පුංචිබණ්ඩාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 011-2187232 |
| 20 | එස්.ඩබ්.බී.අයි.කේ. ප්‍රේමතිලක මහත්මිය | ගණකාධිකාරී (වැටුප් හා ආදායම්) | 011-2187210 |
| 21 | ප්‍රියන්ති ගුණසේකර මහත්මිය | නීති නිලධාරී | 011-2078524 |
| 22 | ආර්.එස්. කුවිනි මහත්මිය | භාෂා පරිවර්තක I (දෙමළ) | 011-2187219 |
| 23 | කේ.ඒ.පී. කීනදෙනිය මහතා | භාෂා පරිවර්තක I (ඉංග්‍රීසි) | 011-2187219 |
| 24 | යූ.සී.එම්. රුද්‍රිගු මහත්මිය | තොරතුරු තාක්ෂණ නිලධාරී | |

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ( ප්‍රවාහන) යටතේ ඇති ආයතන**

01. දුම්රිය දෙපාර්තමේන්තුව
02. ජාතික ගමනාගමන කොමිෂන් සභාව
03. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
04. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
05. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
06. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
07. ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය (ප්‍රවාහන) තුළ ස්ථාපිත අංශ කිහිපයකි.**

01. ලේකම් කාර්යාලය
02. අභ්‍යන්තර පාලන අංශය
03. ගිණුම් අංශය
04. ආයතන පාලන අංශය
05. ඉඩම් අංශය
06. සැලසුම් අංශය
07. කැබිනට් අංශය
08. දුම්රිය පාලන අංශය
09. නීති අංශය
10. අභ්‍යන්තර විගණන අංශය
11. තාක්ෂණ අංශය
12. ප්‍රවාහන අංශය
13. මාධ්‍ය අංශය
14. භාෂා පරිවර්තන අංශය

ඒ ඒ අංශවලින් සිදු කරන මූලික කාර්යයන් පහත පරිදී වේ.

<u>අභ්‍යන්තර පාලන අංශය</u>

- දෛනික තැපැල නඩත්තුව
- ස්ථිර කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව (වැටුප් වර්ධක ලබා දීම, උසස් කිරීම් , ස්ථිර කිරීම , විශ්‍රාම යැවීම්,ස්ථාන මාරු කිරීම්, නිසි කලට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂ පැවැත්වීම, බඳවා ගැනීම් රියැදුර කා.කා.ස, නිලධාරීන්ට අදාළ විනය ගොනු පවත්වා ගැනීම හා විනය නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු)
- අග්‍රහාර රක්ෂණාවරණයේ සාමාජිකත්වය ලබා දීම හා ප්‍රතිලාභ ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- බිල්පත් පියවීම
- හැඳුනුම්පත් හා අවුරුද්දක් පාසා බස් ගමන් බලපත්‍ර කාර්ය මණ්ඩලය වෙත ලබා දීම
- නිවාඩු දුම්රිය බලපත්‍ර ලබා දීම
- සහනදායි පදනම මත ලබා දෙන මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම
- රැස්වීම් හා උත්සව සංවිධානය කිරීම
- තොරතුරු පනතට අදාළ කාර්යයන් සිදු කිරීම
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු සමාලෝචනය කිරීම හා යාවත්කාලීනව පවත්වා ගෙන යාම
- සේවක ණය අනුමත කිරීමට අදාළ කටයුතු කිරීම
- දුම්රිය සංචාරක බංගලා වෙන් කිරීම
- මැතිවරණ රාජකාරී කටයුතු ඉටු කිරීම
- ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ පත් කිරීම්, සේවය අවසන් කිරීම් හා සේවක අර්ථසාධක අරමුදලටදායක මුදල් අයකර ගැනීම් ආදී පුද්ගලික ගොනු නඩත්තු කිරීම. නිදහස් කිරීම සම්බන්ධ කටයුතු
- බාහිර ආයතන වලින් එන විවිධ ලිපි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

- කාර්යාල පරිශ්‍රය පවිත්‍රව තබා ගැනීම හා අධික්ෂණය
- ලේඛනාගාරය පවත්වා ගැනීම හා අධික්ෂණ කටයුතු
- නිලධාරීන්ට අදාළ විනය ගොනු පවත්වා ගැනීම හා නඩත්තු කිරීම, විනය නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු
- අනියම් , තාවකාලික හා අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩල වල පුද්ගලික ලිපිගොනු වැටුප් වර්ධක නිර්දේශ කිරීම හා නිවාඩු වාර්තා යැවීම.

<u>ගිණුම් අංශය</u>

- අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම, අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික වාර්තා අවසාන ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගැනීම.
- සිගාස් (CIGAS) පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කිරීම, මාසික ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම හා මුදල් පොත පවත්වාගෙන යාම.
- සරප් අංශය පවත්වා ගැනීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා මාසික ගිණුම් සැසඳුම් වාර්තා සකස් කිරීම.
- වැය ලෙජරයන් පවත්වා ගැනීම
- පොදු තැන්පත් ගිණුම පවත්වා ගෙන යාම.
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවත්නා සියපුම ආයතනවල මු.රෙ.118 යටතේ රජයේ ආදායමෙන් ආපසු ගෙවීම් හා ඉකුත් ගෙවීම් සඳහා මු.රෙ.115 යටතේ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීම
- වේතන ඇතුලු සියලු ගෙවීම් කටයුතු හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධ කටයුතු සිදු කිරීම
- වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම පිළිබඳ තොරතුරු පෞද්ගලික ලිපිගොනුව වෙත ලබා දීම
- රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට අදාළ අයකිරීම් පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන, ව්‍යාපෘති වලට අදාළව ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම හා ප්‍රසම්පාදන රාජකාරී සම්බන්ධ සියලුම කටයුතු කිරීම.
- විගණන විමසුම්වලට පිලතුරු සැපයීම, රාජ්‍ය ගිණුම් කාරක සභාව (PAC) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සම්බන්ධ කටයුතු කිරීම.
- ගබඩා කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- වත්කම් කළමනාකරණ කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල හානි හා පාඩු පිළිබඳව නියමිත වාර්තා ගෙන්වා ගෙන ඉදිරි කටයුතු කිරීම.
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මු.රෙ. 135 යටතේ ගෙවීම සම්බන්ධව අධිකාරී බලය පැවරීම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශයේ සුළු ටෙන්ඩර් මණ්ඩල කටයුතු හා අමාත්‍යාංශයේ සියළුම යන්ත්‍ර සූත්‍ර උපකරණ, පරිගණක නඩත්තු හා අළුත්වැඩියා සම්බන්ධ රාජකාරී කටයුතු කිරීම.

## ආයතන පාලන අංශය

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව සම්බන්ධ ආයතනික හා පරිපාලන කටයුතු
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන්
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා සම්බන්ධ මහ ජනතාවගෙන් ලැබෙන අභියාචනා සම්බන්ධ කටයුතු
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධ ආයතනික හා පරිපාලන කටයුතු
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධ සංවර්ධන වැඩසටහන්
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් මහජනතාවගෙන් ලැබෙන අභියාචනා සම්බන්ධ කටයුතු
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට අයත් සියලුම ආයතනික කටයුතු
- ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ ආයතනවලට ලැබෙන අභියාචනා සම්බන්ධව ජනාධිපති හා අග්‍රාමාත්‍ය කාර්යාලවලින් ලැබෙන ලිපි හා සම්බන්ධ කටයුතු
- ගම සමග පිළිසඳර වැඩසටහන සම්බන්ධ ආයතනික කටයුතු
- දේශීය හා විදේශීය පුහුණුවීම් හා විදේශ ගමන්, විදේශ නිවාඩු සම්බන්ධ කටයුතු
- සහසර බස් සේවා නවීකරණ වැඩසටහන හා සම්බන්ධ ව්‍යාපෘතියේ සියලුම ආයතිනක කටයුතු
- මහකොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (3K ව්‍යාපෘතිය) හා සම්බන්ධ සියලු ආයතනික කටයුතු
- අවස්ථානුකූලව රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් ආයතනවල ආයතනික හා පරිපාලනමය කටයුතු කිරීම
  - මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
  - ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
  - ලක්දිව ඉංජිනේරු ආයතනය

## ඉඩම් අංශය

- ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පවතින දුම්රිය දෙපාර්තමේන්තුව මගින් දුම්රිය රක්ෂිත ඉඩම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන පහත කාර්යයන් අධීක්ෂණය කිරීම
  - ඉඩම් බදු ලබා දීම හා බදු මුදල් අය කර ගැනීම
  - දුම්රිය දෙපාර්තමේන්තුවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීම හා අත්කර ගැනීම
  - දුම්රිය රක්ෂිත බදු ලබා දීමට අදාළව ඉඩම් මැනුම් කිරීම හා තක්සේරු ලබා ගැනීම
  - දුම්රිය රක්ෂිත ඉඩම් අනවසරයෙන් පරිහරණය කරනු ලබන අනවසරකරුවන් වෙතින් හිඟ මුදල් අය කර ගැනීම
- දුම්රිය රක්ෂිත ඉඩම් සම්බන්ධයෙන් අමාත්‍යාංශයට ලැබෙන මහජන පැමිණිලි, ඉල්ලීම් හා විරෝධතා ලිපි සඳහා කටයුතු කිරීම
- ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන දුම්රිය ඉඩම් පිළිබඳ මහජන පැමිණිලි සම්න්ධයෙන් කටයුතු කිරීම හා මාසික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම
- දුම්රිය ඉඩම් ආශ්‍රිතව සිදු කරනු ලබන රජයේ සංවර්ධන කටයුතු හා රජයේ ආයතන සඳහා වන ඉඩම් බදු ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීම.
- දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වී ඇති දුම්රිය ඉඩම් බදු ඉල්ලීම් සඳහා බදු ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා දීමට අදාළව අමාත්‍යාංශයේ දී පවත්වනු ලබන දෙවන බදු කමිටු රැස්වීම කැඳවීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

- දුම්රිය ඉඩම් බදු ලබා දීම අදාළව දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින් මාසික ප්‍රගතිය ලබා ගැනීම හා සමාලෝචනය කිරීම
- කුරුණෑගල- හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතියට අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි සඳහා කටයුතු කිරීම
- කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතියට අත්පත් කර ගන්නා ලද ඉඩම් සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි සඳහා කටයුතු කිරීම.
- මාතර -කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ ඉඩම් අත්ලත් කර ගැනීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීමට අදාළ කටයුතු සිදු කිරීම
- දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස කුලියට දීම හා සංචාරක බංගලා සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන කටයුතු සිදු කිරීම

<u>සැලසුම් අංශය</u>

- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම (ප්‍රගති වාර්තා / කාර්ය සාධන වාර්තාව)
- කාර්තුමය වශයෙන් ව්‍යාපෘතිවල ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා එක්සත් ජාතින්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන ඇතුළු සංවර්ධන පාර්ශවකරුවන් හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම, සම්බන්ධිකරණය සහ ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- අයවැය යෝජනාවල මාසික ප්‍රගතිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- ‘සෞභාග්‍යයේ දැක්ම’ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් සඳහන් අමාත්‍යාංශ කාර්යභාරයන්ට අදාළ ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය කාර්තුමය වශයෙන් ජනාධිපති කාර්යලය වෙත ඉදිරිපත් කිරීම
- ප්‍රවාහන පද්ධතියට අදාළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

<u>කැබිනට් අංශය</u>

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නියමිත ආකෘතීන් අනුව භාෂාත්‍රයෙන් සැකසීම හා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම.
- අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කිරීම
- අමාත්‍ය මණ්ඩලය වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරීමට අදාළ අංශ මගින් කටයුතු කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.
- ආංශික අධික්ෂණ කාරක සභාවට ලැබෙන පෙත්සම් / පැමිණිලි සම්බන්ධෆයන් වන කටයුතු
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා සම්බන්ධයෙන් වන සියලු කටයුතු
- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් වන සියලුම කටයුතු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා ආංශික අධීක්ෂණ කාරක සභාව සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු, මෙම අමාත්‍යාංශයට අදාළ අයවැය විවාද සම්බන්ධීකරණ කටයුතු/ කල් තැබීමේ විවාද/ ස්ථාවර නියෝග යටතේ අසනු ලබන ප්‍රශ්න/පෞද්ගලික මන්ත්‍රී යෝජනා, පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් කරන ගෙවීම්, පාර්ලිමේන්තු අවසරපත් ලබා ගැනීම, ඇතුලු පාර්ලිමේන්තුව සම්බන්ධ සියලුම රාජකාරී
- මහජන පෙත්සම් සම්බන්ධයෙන් වන සියලුම කටයුතු

දුම්රිය පාලන අංශය

- දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම තනතුර හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ මාරු කිරීම්, විනය රාජකාරී, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අදාළ රාජකාරී කටයුතු කිරීම හා නැවත සේවයේ පිහිටුවීමට අදාළ රාජකාරී කටයුතු අමාත්‍යාංශය මඟින් අදාළ වෙනත් ආයතන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉටු කිරීම
- විදේශ නිවාඩු, හදිසි අනතුරු නිවාඩු හදිසි අනතුරු වන්දි පිළිබඳව රාජකාරී ඉටු කිරීම
- වෘත්තීය සමිති කටයුතු සඳහා සේවයෙන් නිදහස් කිරීම, වෘත්තීය සමිති ඉල්ලීම් හා වෙනත් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- භාවිතයෙන් ඉවත් කරන ලද රේල් පීලි , සිල්පර කොට ඇතුළු අබිලි ද්‍රව්‍ය සහන මිලට ගැනීම සඳහා විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම
- දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුතුව සිටි ජූලි වැඩ වර්ජනවලට ලක්වූවන් තවදුරටත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධව අදාළ කටයුතු සිදු කිරීම
- දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව නව කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014.04.30 දිනැතිව අනුමත කර ඇති අතර එයට අදළාව බඳවා ගැනීමේ පටිපාටි හා වැටුප් පරිමාණ සම්බන්ධව තවදුරටත් සංශෝධනයන් කරමින් පවතී.
- දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ වැටුප් විෂමතාවයන් පිළිබඳව අදාළ කටයුතු සිදු කිරීම
- දුම්රය දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා නව බඳවා ගැනීම් පරිපාටි අනුමත කිරීමේ කටයුතු සිදු කිරීම
- බඳවා ගැනීම් පරිපාටි අනුමත වී ඇති තනතුරු කිහිපයක් සඳහා නව බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඇප මුදල් නිදහස් කිරීම සහ ඇටෝර්නි බලය අවලංගු කිරීම සම්බන්ධ කටයුතු කිරීම
- මහව සිට ඕමන්ත දක්වා දුම්රය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ පත්වීම් සම්බන්ධ කටයුතු සිදු කිරීම
- දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවයෙහි නියුතු විදේශිකයන් සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම

නීති අංශය

- ප්‍රවාහන අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයේ විෂයපථය යටතට ගැනෙන ආයතනවලට අදාළව ගරු අමාත්‍යවරුන්, ලේකම්තුමා හා අමාත්‍යාංශ නිලධාරීන් වග උත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් අවශ්‍ය සියලු කටයුතු ඉටු කිරීම
- ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- පනත් හා රෙගුලාසි කෙටුම්පත් කිරීම හා සම්මත කිරීමට අදාළ කටයුතු
- ප්‍රවාහන අමාත්‍යාංශය පාර්ශ්වකරුවෙකු කරමින් එළඹෙන ගිවිසුම් වලට අදාළ කටයුතු ඉටු කිරීම

අභ්‍යන්තර විගණන අංශය

- ❖ වාහන නඩත්තු කටයුතු විගණනය හා වාහන අලුත්වැඩියාව පිළිබඳ ක්‍රියාකාරකම් හා රිය අනතුරු විගණනය
- ❖ ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදනයන් විගණනය
- ❖ ගිවිසුම්ගත සේවා ප්‍රසම්පාදනයන් විගණනය
- ❖ තොග පොත් පාලනය පිළිබඳ විගණනය
- ❖ අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර් කළමනාකරණය පිළිබඳ විගණනය හා සුළු මුදල් අග්‍රිම ක්‍රියාකාරකම් විගණනය
- ❖ මුදල් එකතු කිරීම හා බැංකු ගත කිරීමේ ක්‍රියාකාරකම් විගණනය
- ❖ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීම
- ❖ ලේඛනාගාර නඩත්තුව විගණනය
- ❖ බැංකු සැසඳීම් කටයුතු හා චෙක්පත් ක්‍රියාකාරකම් විගණනය
- ❖ ප්‍රසම්පාදන සැලැස්මේ ක්‍රියාකාරකම් විගණනය
- ❖ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත පරිදි පිළියෙල කර ඉදිරිපත් කිරීම පිලිබඳ විගණනය කිරීම
- ❖ අමාත්‍යාංශය යටතේ ඇති ඒ ඒ ආයතන සම්බන්ධයෙන් පවරනු ලබන විශේෂ පරීක්ෂණ සිදු කිරීම
- ❖ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධ පවරනු ලබන විශේෂ පරීක්ෂණ සිදු කිරීම
- ❖ ව්‍යාපෘතීන්වල මූල්‍යමය හා භෞතික ප්‍රගතිය මෙන්ම කාර්තුගත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ ක්‍රියාවලිය විගණනය කිරීම
- ❖ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම

තාක්ෂණ අංශය

- ❖ ප්‍රවාහන අමාත්‍යාංශ විෂය යටත් ඇති කර්තව්‍යන් ඉටු කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික රාජකාරී ඉටු කිරීම
- ❖ තාක්ෂණික රාජකාරීවලට අදාළ ප්‍රසම්පාදන මූල්‍ය හා පරිපාලන රාජකාරී ඉටු කිරීම
- ❖ අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන හා ව්‍යාපෘතීන් සඳහා තාක්ෂණික සහය ලබා දීම
- ❖ ව්‍යාපෘති සැලසුම් හා ප්‍රගති සමාලෝචන සඳහා දායකත්වය ලබා දීම
- ❖ නව සංවර්ධන කටයුතු සඳහා සහය ලබා දීම.

ප්‍රවාහන අංශය

- ❖ වාහන ලේඛනය යාවත්කාලීන කිරීම.
- ❖ දෛනික අවශ්‍යතා සඳහා වාහන හා රියදුරන් යෙදවීම
- ❖ අමාත්‍යාංශය සතු වාහන වලට ඉන්ධන ලබා දීම සහ වාර සේවා ඇතුළු සියලුම නිලධාරීන්ට වාහන වෙන් කිරීම හා ආපසු ලබා ගැනීම
- ❖ අමාත්‍යාංශයට අයත් සියලු වාහනවල හදිසි අනතුරුවලට අදාළ රාජකාරී සහ අනතුරු ලේඛනය පවත්වාගෙන යාම
- ❖ අමාත්‍යාංශයට අයත් සියලු වාහනවල රක්ෂණය, දුම් සහතික සහ ආදායම් බලපත්‍ර ලබා ගැනීම
- ❖ වාහන මිලදී ගැනීම, පවරා දීම, පවරා ගැනීම හා අපහරණය පිළිබඳ ක්‍රියා කිරීම
- ❖ මැතිවරණ කටයුතුවලදී අදාළ පරිදි වාහන යෙදවීම
- ❖ අමාත්‍යාංශයට අයත් සංචිත වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම
- ❖ විගණන විමසුම් සඳහා වාර්තා සකස් කිරීම